# මධ්‍යම පරිසර අධිකාරිය
## மத்திய சுற்றாடல் அதிகாரசபை
## Central Environmental Authority

"පරිසර පියස", 104, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
"பரிசர பியச", 104, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை, இலங்கை.
"Parisara Piyasa", 104, Denzil Kobbekaduwa Mawatha, Battaramulla, Sri Lanka. Web : www.cea.lk


අපේ යොමුව / எமது தொடர்பு / Our Ref. CEA/06/EPU/PR/39/2023

ඔබේ යොමුව / உமது தொடர்பு / Your Ref.

දිනය / திகதி / Date 2023.06.18

## මාධ්‍ය නිවේදනය

### කතරගම ඇසළ උත්සවයට යනවානම් වගකීමෙන් කසළ බැහැර කරන්න

**- මධ්‍යම පරිසර අධිකාරිය බැතිමතුන්ගෙන් ඉල්ලයි....**

වගකීමෙන් යුතුව නිසි පරිදි කසළ බැහැර කරන ලෙස රුහුණු මහ කතරගම දේවාලයේ ඇසළ උත්සවය සැමරීම සහ වන්දනාමාන කටයුතු සඳහා කතරගමට පැමිණෙන බැතිමතුන්ගෙන් මධ්‍යම පරිසර අධිකාරිය ඉල්ලා සිටී.

මෙවර රුහුණු මහ කතරගම දේවාලයේ පෙරහැර 2023 ජුනි 19 වැනි දින සිට 2023 ජූලි මස 04 වන දින දක්වා පැවැත්වේ. සාමාන්‍යයෙන් කතරගම ඇසළ උත්සව සමයේ දී බැතිමතුන් ලක්ෂ 15කට ආසන්න පිරිසක් කතරගමට පැමිණෙන අතර අක්‍රමවත් කසළ බැහැර කිරීම නිසා කතරගම නගරය, පූජා භූමිය සහ මැණික් ගඟ ආදී ප්‍රදේශ වල ඝණ අපද්‍රව්‍ය ටොන් 1,700ක පමණ ප්‍රමාණයක් එක් රැස් වේ. මෙම තත්වය පාලනය කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය, කතරගම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ කතරගම පෙරහැර කමිටුව ඒකාබද්ධව වසර ගණනාවක සිට විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන අතර මෙවර ද එය ක්‍රියාත්මක කරයි.

ඒ අනුව, පූජාභූමියට පිවිසෙන ප්‍රධාන පිවිසුම් මාර්ගයන්හි දී ගමන් මලු පරීක්ෂා කර පොලිතීන් මලු වෙනුවට පරිසර හිතකාමී ආදේශක මලු ලබා දීම, කතරගම පූජා භූමිය වෙත බැතිමතුන් ප්‍රවාහනය කරන බස් රථ වල දැනුම්වත් කිරීමේ ස්ටිකර් ප්‍රදර්ශනය, දැන්වීම් පුවරු මගින් සහ අත්පත්‍රිකා බෙදා දෙමින් මහජනතාව දැනුම්වත් කිරීම, ප්ලාස්ටික් බෝතල් එක් රැස් කිරීම සඳහා දැල් ආවරණ කසළ රඳවන ස්ථාපිත කර තිබීම සහ කසළ බැහැර කළ හැකි ස්ථාන සකසා තිබීම ඇතුළු විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් නිවැරදිව කසළ බැහැර කිරීම සඳහා බැතිමතුන් යොමුකිරීමට කටයුතු යොදා තිබේ. පාද යාත්‍රා මාර්ගයේ ද කසළ නිසි ලෙස බැහැර කිරීමට අවශ්‍ය පහසුකම් සකසා ඇත. එමෙන්ම ඇසළ උත්සවය අවසන් වූ පසු පූජා භූමිය ශ්‍රමදාන වැඩසටහන් මගින් පවිත්‍ර කිරීමටත් කසළ ප්‍රතිචක්‍රීකරණය සඳහා කටයුතු කිරීමටත් අවශ්‍ය පියවර ගෙන තිබේ.

කතරගම නගරය, පූජා භූමිය සහ මැණික් ගඟ ආදී ප්‍රදේශ අවිධිමත් කසළ බැහැර කිරීම මගින් දූෂණයවීම වැළැක්වීම වැඩසටහනේ අරමුණයි.

මාධ්‍ය සම්බන්ධීකරණය - මාධ්‍ය නිලධාරී - ශ්‍රියාන්ජනී ලොකුලියන - 0776252288

සුපුන් එස්. පතිරගේ
සභාපති
මධ්‍යම පරිසර අධිකාරිය




| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **Chairman** | Tel : 2872361, 2872348<br>Fax : 2872347 | **Director General** | Tel : 2872359<br>Fax : 2872608 | **General Office** | Tel : 2872278, 2873447, 2872419, 2873448 | **Hotline for Inquiries :** 2888999<br>**Environmental Complaints:** 1981 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **D.D.G** | **HRD.Admin. & Finance**<br>Tel: 2865296 Fax : 2877515 | **Envt. Protection**<br>Tel :2873453 Fax : 2872605 | **Envt. Mgt. & Assessment**<br>Tel :2872388 Fax : 2872296 | **Envt. Edu. & Awareness**<br>Tel : 2872297 Fax : 2872609 | **Waste Managment**<br>Tel : 2872409 Fax : 2882152 | **Regional Oper.**<br>Tel : 2872370<br>Fax : 2872275 |

පරිසර අමාත්‍යාංශය | சுற்றாடல் அமைச்சு | Ministry of Environment